# 17 මුහුදු වෙරළ හා මුහුදු සත්තු

මූදු වෙරළේ සෙල්ලම් කිරීමට ළමයි ඉතා ආශා ඇත්තෝ ය. සමහර ළමයි රළ පාගමින් වෙරළේ ඔබ මොබ දුවති. වෙරළට ළංව බිඳ වැටෙන රළයක් වේගයෙන් ගොඩට දිවෙයි. රළ පාගමින් සිටින ළමයි ද රළයට අසු වී ඇඳුම් තෙමෙතැයි බයෙන් වහ වහා වෙරළට දුවති. රළය බිඳ වැටීමෙන් ගලන වතුරෙන් කොටසක්, තීන්ත පොවන කඩදාසියක් තීන්ත උරා ගන්නාක් මෙන්, බුරුල් පස් අතරින් පොළොව උරා ගනියි. ඉතුරු වන වතුර වහ වහා ආපසු මූදට ම ඇදී යයි. ළමයි ද ප්‍රීතියෙන් බැස යන වතුර පාගමින් දුවති.



සමහර ළමයි වෙරළේ ඇවිදිමින් සිප්පි කටු, කවඩි, හක්කැට හා බට්ටන් අවුල අවුලා ඔඩොක්කුවල පුරවා ගනිති. නැති නම් කොට්ට උරවල දමා ගනිති. බට්ටා කවුරුත් අඳුනති. එය හැඩහුරුකමින් හා පාටින් ද සියඹලා ඇටයක් වැන්න. එසේ වුව ද බට්ටා සියඹලා ඇටයකට වඩා ලොකු ය. බට්ටෝ ගඟබඩවල ගස්වල එතෙමින් දුවන වැල්වල හට ගන්නා ඇට වගයකි. බට්ටන් මූදට ලැබෙන්නේ කෙසේ ද? නටු පර වීමෙන් හෝ සුළඟින් හෝ ගිළිහී වැටෙන බට්ටෝ ගඟේ පාවෙති. ගඟේ වතුර මූදට වැටෙන කල බට්ටෝ ද ඒ සමග නැවත මූදට පාවෙති. මූදේ වැටුණු කල රළ බිඳ වැටීම නිසා බට්ටෝ වෙරළේ ගොඩ ගැසෙති.



බට්ටෝ



සිප්පි කටු හා කවඩි ආදිය

සිප්පි කටු හා කවඩි මූද වමාරන දේ ය. සිප්පි කටු හා කවඩි, වැල්වල හෝ ගස්වල හටගන්නා දේ නොවන බැව් කවුරුත් දනිති. එසේ වුව ද මේ කුඩා ගෙවල නවාතැන් ගෙන සිටි සතුන්ට කුමක් වී දැයි බොහෝ ළමයි නො දනිති. පාර අයිනේ පාළු ගෙයක් දකින්නට ලැබුණොත් එහි වරක් මිනිසුන් වාසය කළ බව කුඩා ළමයකුට වුවත් වහා ම කල්පනා වේ. මූදු වෙරළේ ගොඩ ගැසෙන සිප්පි කටු කවඩි යන ආදිය පාළු ගෙවල් වැන්න. ඒ ගෙවලට ද අපට කියා දෙන්නට එක එක කතාව බැගින් ඇත්තේ ය. සිප්පි කටු කතා කරත් නම් ඔවුහු කොතරම් දුක් මුසු කතා අපට කියත් ද?

ඉස්සර කාලේ ගස් ගල් කතා කළ බව පුරාණ ජන කතාවලින් ප්‍රකාශ වේ. මූදු වෙරළේ සිප්පි කටුවලටත් කවඩින්ටත් කතා කරන්නට පුළුවන් නම් ඉස්සර කාලේ ගස් ගල් කළෑ යි කියන කතාවලට වඩා පුදුම කතා අපට අසන්නට ලැබෙනු නිසැක යි. ළමයින් අවුලන සිප්පි කටු අතුරින් අපි එකක් තෝරා ගනිමු. එය හැඩහුරුකමින් සීනි පිට්ටු අච්චුවක පියනක් වැන්න. නැති නම් කිරි ගොටුවක් වැන්න. හැඩහුරුකමින් එසේ වුවත් පාටින් හා පෙනුමෙන් ඒ දෙකට ම වඩා ශෝභන ය. මේ සිප්පි කටුව සමහර පළාත්වල ගෑනු අය හුනු දමන කිල්ලෝට පියනක් මෙන් පාවිච්චි කරති. මේ බෙලි කටුවක් හැඩහුරුකමින් කිරි ගොටුවක් වැන්නැයි කීවේ මුණින් නැමූ කිරි ගොටුවෙහි මැද තුඩ වැනි උස් වූ තුඩක් එහි ද ඇති බැවිනි. කතා කළ හැකි නම් බෙලි කටුව මෙසේ කියනවා ඇත.

> "මම ගල් පරයක ඇලී ජීවත් වුණෙමි. ගලේ සෑදෙන පෙඳ සෙවෙල් මට ආහාර විය. මගේ දිවෙන් ගලේ පෙඳ සෙවෙල් පීරිගාගෙන කෑමට මම රෑ කාලයේ ඇවිද්දෙමි. කෑම සෙවීමට කොතැනකට ගියත් ආපසු පළමු සිටි තැනට ම යාම මගේ සිරිත යි. කාටවත් හිංසාවක් පීඩාවක් නො කොට ගල උලා කමින් ජීවත් වන නමුත් මටත් මගේ ජාතියේ අනික් ඇත්තන්ටත් බොහෝ සතුරෝ සිටිත්. ඇතැම් පක්ෂීහු අහසින් බැස තුඩෙන් ඇන අප ගසා ගෙන ඉගිළ යෙති. ගලක් උඩ තියාගෙන මස් ටික කා අපගේ පොතු බිම දමති. කකුළුවා ද අපේ සතුරෙකි. ඌ රෑ කාලයේ අප සොයා ඇවිත් අඬුවලින් අල්වා ඇද ගලවා කට දික් කොට මස් ටික කා දමයි. බූවල්ලා ද අපේ සතුරෙකි. මොවුන් හැර තවත් අපට බොහෝ සතුරෝ සිටිති. මා මරා මදය කෑවේ බූවල්ලෙකි."

බෙලි කටුව කතා කරයි නම් මෙබඳු ශෝකජනක කථාවක් අපට කියනු සැක නැත. හුලස් හැඩය ඇති බෙලි කටුවට පමණක් නොව අනික් බෙලිකටුවලට ද මෙබඳු කතාන්දරය බැගින් කියන්නට ඇත්තේ ය. වෙරළේ ගොඩ ගැසෙන බෙලිකටු හා කවඩි, මූදේ අනික් සතුන්ට ගොදුරු වන බෙල්ලන්ගේත් කවඩින්ගේත් කටු ය.

විද්‍යා විනෝද කතා v
මාර්ටින් වික්‍රමසිංහ

## අවබෝධය

1. පාඩම කියවා පහත සඳහන් ප්‍රශ්නවලට උත්තර දෙන්න.

   i. රළ පාගමින් සිටි ළමයින් වහ වහා වෙරළට ගියේ ඇයි?

   ii. තීන්ත පොවන කඩදාසියක් තීන්ත උරා ගන්නාක් මෙන් පොළොව උරා ගන්නේ මොනවා ද?

   iii. වෙරළේ ඇවිද ගිය ළමයින් ඔඩොක්කුවල පුරවා ගත්තේ මොනවා ද?

   iv. බෙල්ලන්ගේ ආහාර මොනවා ද?

   v. “ ‘සිප්පි කටු’ හා ‘කවඩි’ මූද වමාරන දේ ය” යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?

## ක්‍රියාකාරකම 1

ගැළපෙන වචනය වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.

(සෙල්ලම් කරති, සැරිසැරුවෙමි, ගත්තෙමු, පියඹා යති)

1. ගලේ පෙඳ සෙවෙල් පීරිගාගෙන කෑමට මම රෑ කාලයේ ..............................
2. ඇතැම් පක්ෂීහු අහසින් බැස තුඩෙන් ඇන, අප ගසා ගෙන .............................
3. ළමයි ප්‍රීතියෙන් බැස වතුර පාගමින් .......................................
4. අපි සිප්පි කටු අතුරින් එකක් තෝරා .....................................

## ක්‍රියාකාරකම 2

1. "මම මුහුදු වෙරළ වෙමි." මාතෘකාව යටතේ නිර්මාණාත්මක වැකි 5ක් ලියන්න.
2. වර්තමාන කාල ක්‍රියා පද සහිත වාක්‍ය පහක් පාඩමෙන් තෝරා ලියන්න.

## ක්‍රියාකාරකම 3

පාඩමෙන් තෝරා වගුව සම්පූර්ණ කරන්න.

| ස්ථාන නාම | සත්ත්ව නාම | පුද්ගල නාම | ද්‍රව්‍ය නාම |
|---|---|---|---|
| | | | |